www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: "එක්සත් බව" සහ "ස්වෙච්ඡා ශ්‍රමය" සඳහා ජවිපෙ වංචනික ඉල්ලීම

**Sri Lanka: the JVP's bogus appeal for "unity" and "voluntary labour"**

**කේ රත්නායක විසිනි**
**2005 ජනවාරි 24**

ශ්‍රී ලංකාවේ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) දෙවන විශාලතම පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සුනාමි විනාශයෙන් අනතුරුව මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට බරපතල ලෙස වල කපන්නා වූද යලි ගොඩනැගීමේ බර වැඩ කරන ජනතාවගේ කර මත පටවන්නා වූද සැලැස්මක් ඉදිරිපත් කර තිබේ.

මෙය ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ ඇති වූ බිහිසුනු ම ව්‍යසනය යි. මිය ගිය සංඛ්‍යාව 40,000 ඉක්මවා ගිය අතර මල සිරුරු තවමත් හමුවෙමින් තිබේ. 90,000ක් පමන නිවාස විනාශ වී දස ලක්ෂයක් තරම් මිනිසුන් අවතැන් විය. බොහෝ දෙනාට සිය පවුලේ සාමාජිකයන් මෙන්ම ජීවිකා වෘත්තීන් ද අහිමි විය. විපතට පත් අති මහත් බහුතරය ඉතා මත් ම අනතුරුදායක ස්ථානයන්හි ජීවත්වූ ගැමියන්, ධීවරයන් සහ මුඩුක්කු වාසීන් වූ දුප්පතුන් ය.

එජනිස පාර්ශ්වයෙන්, මෙම ව්‍යසනය ඔවුන්ගේ දේශපාලන අර්බුදය තව දුරටත් ගැටලු සහගත කර ඇත. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් පෙර පැවැති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව නෙරපා හැරීමෙන් අනතුරුව මේ සභාගය පසුගිය අප්‍රේල් මැතිවරනය යම්තමින් ජය ගත්තේ ය. එහෙත් නව පාලනය රටේ දිගුකාලීන සිවිල් යුද්ධය නිම කිරීම සඳහා සාම කථා යලි ඇරඹීමට හෝ ගොඩගැසී ඇති ආර්ථික ගැටලු විසඳීමට හෝ අසමත් විය. ජීවන තත්වයන් කාබාසිනියා කිරීම පිලිබඳ එජාපෙ හෙලා දුටු එජනිසය ද කඩකරන ලද මැතිවරන පොරොන්දු සහ ඉහල යන බඩු මිල පිලිබඳව විරෝධතාවයන්ට ඉලක්ක විය.

සුනාමි ව්‍යසනයෙන් සති හතරක් ඉක්ම ගොස් තිබිය ද ආන්ඩු විරෝධී සතුරුකම් සඳහා පසුබිම සැකසී ඇත. දිවි ගලවාගත් බොහෝ දෙනා ද හදිසි ආපදා සේවකයන් ද තවත් අය ද පෙර අනතුරු ඇඟවීම් නො තිබීම සහ නිල සහන සේවාවන්ගේ අප්‍රමානවත් බව පිලිබඳව සාධාරන ලෙසම කෝපාන්විතව සිටී. සියල්ලටමත් වඩා, ආන්ඩුවේ ශෝචනීය උත්සාහයට ප්‍රතිරූපීව සාමාන්‍ය වැඩකරන ජනතාව විපතට පත්වූවන්ගේ වාර්ගිකත්වය හෝ ආගම නොතකා ඔවුන්ට පිහිට වීම සඳහා සියලු කටයුතු තමන්ගේ අතට ගෙන මැදිහත් වූහ.

ස්වයං පරිත්‍යාගයේ මෙම මනෝ භාවයන් ආන්ඩුවට මුක්කුවක් තැබීම සඳහා ගසාකෑමටත් සිය වාසියට යොදා ගැනීමටත් ජවිපෙ කැසපට ගසයි. 1960 ගනන්වල දී සිංහල ස්වෝත්තමවාදය සහ ගොවි පෙරලිකාරිත්වය මත පදනම්ව ගොඩ නැගුන මෙම පක්ෂය දැන් ප්‍රථම වතාවට බලයට පැමින තිබේ. මොවුන්ගේ ප්‍රධානතම ලක්ෂනය වන්නේ දෙමල විරෝධී වර්ගවාදය සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය තලා දැමීම සඳහා යුද්ධය දිගට ම ගෙන යාමට සහාය දීම ය. තමන් සමාජවාදීන් යයි ඉඳහිට කරන ප්‍රකාශයන් තිබියදී ම ජවිපෙ දැන් කඩාවැටෙන ජීවන තත්වයන්ට මග පාදන ධනපති ආන්ඩුවක කොටසකි.

ජවිපෙ යෝජනාවන්ගේ ප්‍රධාන තල්ලුව ''ජාතික එක්සත් බව'' සඳහා ය. කුමාරතුංග හෝ ඇය නැතිවිටෙක අගමැතිවරයා හෝ ප්‍රධානත්වයෙන් ''ජාතිය ගොඩ නැගීම සඳහා වන ජාතික ක්‍රියාකාරී මධ්‍යස්ථානය''ක් පිහිටුවන ලෙස ඔවුහු කියා සිටිති. මෙම මධ්‍යස්ථානය සන්නද්ධ හමුදා හා පොලිස් ප්‍රධානීන්, ව්‍යාපාරික ලොක්කන් බුද්ධිමතුන් සහ වෘත්තිකයින් හා එක පෙලට සිටින ''සියලු දේශපාලන පක්ෂ හා දක්ෂ නිලධාරීන්'' ගෙන් සමන්විත වන්නේ ය. මෙම මඩුල්ල ''ජාතික සම්මේලනය''ක් හරහා පිහිටුවනු ඇති අතර යලි ගොඩ නැගීමේ සියලු කර්තව්‍යයන්හි වග කීම එයට පැවරේ.

ඕනෑම පක්ෂයකට 'ජාතික ක්‍රියාකාරී මධ්‍යස්ථානය'ට සම්බන්ධ විය හැකි නමුත් ඒ සඳහා ඔවුන් ''ගැටුම්කාරී දේශපාලන වෙනස්කම්'' වසරකට හෝ දෙකකට ඉවත ලිය යුතු ය. 'එක්සත් බවේ' සහ 'ජාතිය ගොඩනැගීමේ' ප්‍රෝඩාව යටතේ ජවිපෙ යෝජනා කරන්නේ විරුද්ධවාදීන් හා එකඟ නොවන්නන් මැඩ ලීම සඳහා ආන්ඩුව, හමුදාව සහ රාජ්‍ය සංස්ථාපිතය ආධිපත්‍යය දරන්නා වූ ඒකාධිපති යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීමට ය.

'දේශපාලන වෙනස්කම්' අවසන් කරන එකඟතාවයක් යන්නෙන් සියල්ලටමත් වැඩියෙන් අදහස් කරන්නේ ආන්ඩුව පිලිබඳව මොනයම් ම හෝ විවේචනයක් කිරීම නවතා දැමීම ය.

වියුක්ත ආකාරයකට එක්සත්කම සඳහා කැඳවීම්

කරන අතරේදීම එල්ටීටීඊ හෝ ඊට පක්ෂපාතී කන්ඩායම් මෙයට ඇතුලත් කර නොගත යුතු බව ජවිපෙ පැහැදිලිව කියා සිටී. සැබැවින්ම එල්ටීටීඊයට විරුද්ධව ආක්‍රමනශීලී පිලිවෙතක් ගැනීමට මේ හොඳම අවස්ථාව බව පක්ෂ නායකයන් අදහස් දක්වා තිබේ. මිලිටරියේ උසස් නිලධාරීන් කොටසක් ද මෙම අදහස ම දරයි.

ජනවාරි 9 දා *අයිලන්ඩ්* පුවත්පතට ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක විමල් වීරවංශ ප්‍රකාශ කර තිබුනේ සුනාමිය හේතුවෙන් එල්ටීටීඊයට පෙර නොවූ විරූ ආකාරයේ මිනිස් බලය හා සම්පත් විනාශයක් සිදුවී ඇති බවත් ඉන් ''ඔවුන්ගේ ප්‍රහාරක ශක්තිය නිශ්චිතවම මොට්ටවී තිබෙන'' බවත් ය.

එල්ටීටීඊයේ අන්තර්වාර පරිපාලන යෝජනා පිලිබඳව ඔවුන් සමග සාකච්ඡා කිරීමේ සියලු සැලසුම් ඉවත දමන ලෙස ට ඔහු ආන්ඩුවට ඇනුම් දුන්නේ ය. මෙම පියවර යුද්ධයට තුඩු දෙනු ඇතැයි එල්ටීටීඊ ය අනතුරු අඟවා තිබේ.

එල්ටීටීඊ හිතවාදී සංවිධාන හරහා සුනාමියෙන් විපතට පත්වූවන්ට ආධාර යැවීමට විරුද්ධ වීම මගින් ජවිපෙ වර්ගවාදී ආතතීන් ඇවිලවීමට මාන බැලී ය. දශක දෙකක යුද්ධයෙන් විනාශ වූ රටේ උතුරු නැගෙනහිර හරියටම සුනාමි ගමන් මගෙහි පිහිටියේ ය. විපතට පත්වූවන්ගෙන් බොහෝ දෙනා එල්ටීටීඊ පාලන ප්‍රදේශවල විසූ දෙමල ජාතිකයන් වූ අතර ඔවුනට ආධාර ලබා ගත හැකි අන් මූලාශ්‍රයක් නැත.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අන්නන් ද ඇතුලු විදේශ නිලධාරීන් හෝ දේශපාලනඥයන් එල්ටීටීඊය සමග මොනයම් හෝ නිල සබඳතාවයක් ඇති කර ගැනීම පිලිබඳව ද මෙම පක්ෂය විරුද්ධ විය. ජනවාරි 8 දා පැවැත්වුන නිල පිලිගැනීමේ උත්සවයක දී ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ එල්ටීටීඊය පිලිබඳව අන්නන්ට ගතු කියමින් ජාත්‍යන්තර ආධාර එල්ටීටීඊය සමග සබඳතා පවත්වන කිසිදු කන්ඩායමකට නොදිය යුතු යැයි අවධාරනය කලේ ය.

### "ස්වේච්ඡා වැඩ"

ඔවුන්ගේ ''ජාතික ක්‍රියාකාරී මධ්‍යස්ථානය'' යටතේ පුලුල් නිලධාරී තන්ත්‍රයක් අටවන ලෙසට ජවිපෙ යෝජනා කරයි. දත්ත එකතුව, සැලසුම් කිරීම, සුබසාධන කටයුතු, මානව සම්පත් කලමනාකරනය, ජාත්‍යන්තර සහ ජාතික ආධාර රැස්කිරීම, ජාතික ජන සන්නිවේදන මාධ්‍ය සහ මූල්‍ය හා විගනනය සඳහා උප මධ්‍යස්ථාන 7ක් පිහිටුවිය යුතු ය.

ජවිපෙ පන්ති ස්වභාවය පිලිබඳව මින් එක් උපමධ්‍යස්ථානයක් - මානව සම්පත් කලමනාකරනය -සුවිශේෂයෙන්ම ඇස් අරවන සුලු ය. මෙම මෙවලමේ ප්‍රධාන කටයුත්ත වනුයේ ''ජාතිය ගොඩනැගීම'' වෙනුවෙන් ''ස්වේච්ඡා වැඩ'' කිරීමට මහජනයා පෙලඹවීම සහ අවශ්‍ය වුවහොත් ඊට බලහත්කාරයෙන් යෙදවීම ය. එය 'ස්වේච්ඡාවෙන්' හෝ 'අර්ධ වැටුපට' විය හැකි බව ප්‍රකාශ කරන ජවිපෙ, එසේ නමුදු මධ්‍යස්ථානය ''සතියට එක් දිනයක් ස්වේච්ඡා ශ්‍රම දිනය ලෙස නම් කරන'' අතර ''ලක්ෂ ගනනක් ජනතාව ස්වේච්ඡා කටයුතු මොනවාද ඒවා කරන්නේ කොහිද යන්න පිලිබඳව මධ්‍යස්ථානය තීරනය කල යුතු ය'' කියා ද පවසයි.

''ස්වේච්ඡා වැඩ'' සඳහා වන ජවිපෙ යෝජනාව මුදල් හා භාන්ඩ පරිත්‍යාග කල විපතට පත්වූවන්ට උදව් කිරීමට කන්ඩායම් වශයෙන් මෙහෙයවුන බොහෝ සාමාන්‍ය මිනිසුන්ගේ පරිත්‍යාග සමග මොනම සම්බන්ධයක් වත් නැත. ඔවුන් තමන්ගේම නිදහස් කැමැත්තෙන් එසේ කටයුතු කලේ මෙවන් බොහෝ අවස්ථාවල දී ආන්ඩුවෙන් කිසිදු උදව්වක් නොසැලසෙන බව ඔවුන් දන්නා නිසාවෙනි. ජවිපෙ සැලසුම මෙහි ප්‍රතිවිරුද්ධය යි. මේ උත්සාහය සියලු ස්වේච්ඡා ක්‍රියාකාරීන් සිය නොහැකියාව ප්‍රදර්ශනය කල ආන්ඩුවකට යටත් කර ඒ වෙනුවෙන් පෙල ගැස්සවීමට සහ අනෙකුත් අය 'ස්වේච්ඡා' ශ්‍රම බලකායන්ට බලහත්කාරයෙන් බැඳ ගැනීම සඳහා ය. තමන් කරන දෙය පිලිබඳව ස්වේච්ඡා සේවකයින්ට කිසිදු අයිතියක් හෝ බලයක් නොමැති බව පැවසීම අවශ්‍ය නැත.

මෙම පක්ෂයේ ඉතිහාසයෙන් ම ජවිපෙ සැලැස්මේ ගති ලක්ෂනය එලිදරව් වෙයි. 1980 අග භාගයේ දී මොවුහු ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව තම ස්වෝත්තමවාදී උද්ඝෝෂනයේ කොටසක් ලෙස කම්කරුවන්ට තුවක්කු එල්ල කර වැඩ වර්ජන හා විරෝධතාවලට එක්වීමට බල කලෝ ය. 'ජාතිය ගලවාගැනීමේ' ඔවුන්ගේ පාදඩ දේශානුරාගී ව්‍යාපාරයට සහාය වීම ප්‍රතික්ෂේප කල සිය ගනනක් වෘත්තීය සමිති නායකයෝ, පක්ෂ නිලධාරීහු හා සාමාන්‍ය කම්කරුවෝ ජවිපෙ සන්නද්ධ මැර කල්ලි විසින් මරා දමනු ලැබී ය. 1994 නීත්‍යනුකූල තත්වය ලැබූ තැන් පටන් මොවුහු එවැනි විධික්‍රමයන් ආකාරගතව නතර කර දමා ඇත. එහෙත් පාලක සභාගයේ කොටසක් ලෙස ජාතික ප්‍රතිසංස්කරනයට ''ස්වේච්ඡා සේවකයන්'' පෙල ගස්වා ගැනීමේ ඔවුන්ගේ සැලසුම් පිටිපසින් ජවිපෙට දැන් රාජ්‍ය සංස්ථාපිතය තිබේ.

සුනාමි ව්‍යසනයට පෙර පවා ජවිපෙ පසුගිය වසරේ අයවැයෙන් දුන් වැටුප් වර්ධකයට හිලව් වශයෙන් සියලු රජයේ සේවකයන්ගෙන් දිනකට අතිරේකව පැයක් 'ස්වේච්ඡා' සේවාවක් ලබා ගැනීමට බල කලේ ය. දැන් ජවිපෙ ආන්ඩුවේ යලි ගොඩනැගීමේ කටයුතුවලට උදව් වීමට කම්කරුවන් සතියකට එක් දිනක වැටුප පිදිය යුතු යැයි යෝජනා කරයි. බොහෝ සේවකයන්ට මෙවන් වැටුප් පරිත්‍යාගයක් බරපතල ආර්ථික අහේනියකට ඔවුන් ඇද හෙලීමක් වනු ඇත. සාමාන්‍ය කම්කරු ජනයා පරිත්‍යාග කල යුතු යැයි බල කර සිටින ජවිපෙ ඊට සමාන්තරව ආන්ඩුව සිය ප්‍රමුඛතා වෙනස් කරනු හෝ දැවැන්ත ආරක්ෂක වියදම් කපා හැරිය යුතු යයි යෝජනා කරන්නේ නැත.

*රතු ලංකා* පුවත්පතේ ජනවාරි කලාපයට අනුව ජවිපෙ දැනටමත් සිය වෘත්තීය සමිති සාමාජිකයන් 5000ක් ස්වෙච්ඡා වැඩට පිටත් කර යවා තිබේ. සමස්ත ලංකා දුම්රිය පොදු සේවක සංගමයේ නායක සරත් මානවඩු වෘත්තීය සමිතියේ 'යහපත් වැඩ' ගැන ගමනාගමන ඇමතිගේ ප්‍රසංශාව පිලිබඳව පුවත්පතකට පම්පෝරි ගැසී ය. ඇමතිවරයා ජනාධිපතිනියට මෙසේ කීවේ යැයි වාර්තා විය: ''මානවඩුලා (මානවඩුගේ සාමාජිකයන්) පරිත්‍යාගයන් නොකලේ නම් අපට කෝච්චි දුවවන්න බැරි වෙනවා.''

''ජාතිය යලි ගොඩ නැගීමේ'' නාමයෙන් තමන්ගේම ඉල්ලීම් සඳහා වන ඕනෑම කම්කරු අරගලයක් ඔවුන් විසින් මර්දනය කරන බව ද ජවිපෙ ඇඟවුම් කලේ ය. 'කාර්මික සාමය' සඳහා කුමාරතුංග ගේ වෘත්තීය සමිති හිතවතෙකු කර තිබූ ඉල්ලීමකට ප්‍රතිචාර වසයෙන් කුඩා හා ග්‍රාමීය කර්මාන්ත පිලිබඳව ජවිපෙ ඇමති කේ.ඩී. ලාල් කාන්ත ප්‍රකාශ කලේ ජවිපෙ, ''සේවක සුභසාධනය පිලිබඳව වූ වැටුප් වැඩි කිරීමේ හා අනෙකුත් ඉල්ලීම් සම්බන්ධ වෘත්තීය සමිති ක්‍රියා මාර්ගවලින් වැලකී සිටීමට'' එකඟ වූ බව ය.

ජවිපෙ සැලසුම් ක්‍රියාවට නැංවුවහොත් පලල්ව පැතිරුන විරුද්ධතාවයක් ජනනය වීම පිලිබඳව කිසිදු සැකයක් නැත. විරෝධතාවන්ගේ හුස්ම සිරකිරීම හා සිංහල ස්වෝත්තමවාදීන් ඇවිලවීම සඳහා ජාතික ජනමාධ්‍ය මධ්‍යස්ථානයක් ඇති කිරීමට ජවිපෙ යෝජනා කරයි. දැස් නිලංකාර කරවන ප්‍රචාරයක කොටසක් ලෙස ජවිපෙ, ''දේශානුරාගය සහ ජාතික එක්සත්බව පෙරට දැමීමට විශේෂයෙන්ම තරුනයන් එල්ල කර ගත්හ.... ඒ ජාතිකවාදී දෘෂ්ටිවාදයකින් ජාතිය ගොඩ නංවනු පිනිස ය...'' මධ්‍යස්ථානයම කියා සිටී.

ජාතියේ නාමයෙන් එක්සත් වන ලෙස සියලුම පක්ෂවලට කරන ආන්ඩුවේ හා ජන මාධ්‍යවල තල්ලුව සමග ජවිපෙ යෝජනා එක පෙලට සිටී. ජනාධිපති කුමාරතුංග සුනාමියෙන් පසු කරන ලද ඇගේ ප්‍රථම කතාවේ දී විපතට පත්වූවන්ගේ නාමයෙන් 'එක්සත්' වන ලෙස ඉල්ලා සිටියා ය. මෙවන් අර්බුදකාරී අවස්ථාවකදී සිය වෙනස්කම් පසෙකට ලන ලෙස කතු වැකි ගනනාවකින් ප්‍රධාන පක්ෂවලට කියා සිටින ලදී. දේශපාලන සංස්ථාපිතයේ කනස්සල්ලට හේතු වී තිබෙන්නේ ලක්ෂ ගනනක්වන දිවි ගලවා ගත්තවුන් මුහුන දෙන දික්ගැසෙමින් හා දුෂ්කරතාවයන් නොව කම්කරු ජනතාවගේ පාර්ශ්වයෙන් පිපිරී යාහැකි ආන්ඩු විරෝධයක අන්තරාය ය.

ජවිපෙ සැලැස්මට ලද නිල ප්‍රතිචාරය සතුටුදායක විය. ජවිපෙ යෝජනා තමන්ට ලැබුන බව ද ඒවා සලකා බලනු ඇති බව ද කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රකාශකයෙකු පැහැදිලි කලේ ය. කුමාරතුංග දැනටමත් සහන කටයුතු අධිකාරියට මිලිටරිය යෙදවීම ද අතිශය කටුක හදිසි නීති රෙගුලාසි පැනවීම ද ඇතුලු ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් මාලාවක් ම ක්‍රියාවට නංවා තිබේ.

ලංකා සමසමාජ පක්ෂය සහ කොමියුනිස්ට් පක්ෂය වැනි අපකීර්තිමත් සම්ප්‍රදායානුකූල කම්කරු පක්ෂ මත තව දුරටත් රඳා පැවතීමට නොහැකි පාලක පැලැන්තිය එවන් ඒකාධිපති පියවරයන් සහ කම්කරු පන්තියෙන් මතුවන ඕනෑම විරුද්ධත්වයක් මැඩලීම නීතියුක්ත කිරීම පිනිස වැඩි වැඩියෙන් ජවිපෙ මත රැඳී සිටී.

© www.wsws.org